**මැදගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ සභාව සතු ඉඩම් කැබැලි 9 ක වටිනාකම සහ ගොඩනැගිලි 15 ක වටිනාකමද ඇතුලුව ගිණුම් ගත නොකළ ඉඩම් කැබැලි 76 ක වටිනාකම පිළිගත් වෘත්තිය තක්සේරු කරුවකු ලවා තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත් කරන ලද බස් නැවතුම්පල ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු. 908,000 ක් සංචලන වත්කම් යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.3.2 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු හිඟ පළාත් පාලන විශ්‍රාම වැටුප් රු. 216,685 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 133,875,398 ක වත්කම් විෂයන් 2 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

**1.3.4 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| | 19 (1)(i) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව තනතුරු දෙකක් සඳහා පුද්ගලයින් දෙදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය අවසානයට රු. 211,287ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| | මු.රෙ. 71 | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පටහැනිව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ යන්ත්‍ර සහායක, තාක්ෂණික සහායක හා මුරකරු, යන තනතුරු සඳහා සේවකයින් 3 දෙනෙකුට අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. |
| (ඇ) | **1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | |
| | රීති අංක 177 හා 178 | සභාව සතු දේපල 4ක් සමාලෝචිත වර්ෂයේදී ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායම රු. 5,579,414 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,521,335 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 2,941,921 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 හිඟ ආදායම්

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,959,145 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 1,045,503 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 400,949 ක මුදලක් අයකර ගැනිමට තිබුණි.

#### 2.2.3 වරිපනම් බදු

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 138(1) වගන්තියේ විධිවිධාන අනුව වරිපනම් බදු වර්ෂ 5 කට වරක් තක්සේරු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2(1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත්

පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු.117,350 ක වියදමක් දරා තිබුණි.

(ආ) 2004 ජුනි 25 දින සභාව විසින් කර්මාන්ත ගෙවීම් වෙනුවෙන් ආරම්භ කරන ලද මහජන බැංකුවේ මැදගම ශාඛාවේ ජංගම ගිණුම් අංක 258100190000008 දරන ගිණුමේ ගනුදෙනු කටයුතු සමාලෝචිත වර්ෂයේ ජුලි 21 න් පසුව නතර කර තිබුණි. ඒ අනුව අදාල ජංගම ගිණුමේ ශේෂය වූ රු. 604,830 ක් මේ දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) තනතුරු 5කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 8 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදි යොදවාගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

### 3.2.1 ආදාහනාගාරය ඉදිකිරීම

---------------------------

ආදාහනාගාරය ඉදිකිරීම සඳහා අදියර I හා II යටතේ පිළිවෙලින් රු.9,529,981 ක් සහ රු.12,096,251 ක් වශයෙන් ඇස්තමේන්තු දෙකක් සකස් කර 2014 ඔක්තෝබර් 30 දින කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත් ගිවිසුම් දෙකක් යටතේ රු.7,650,460 ක් සහ රු.9,653,723 ක ගිවිසුම්ගත මුදලකට පවරා තිබුණි. 2015 ජනවාරි 30 දිනට පෙර වැඩ අවසන් කළ යුතු වුවත්, 2016 මැයි 12 දින වන විටත් එහි වැඩ කොටස් අවසන් කර නොතිබුණි.

### 3.2.2 මැදගම සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම

----------------------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මැදගම සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම සඳහා අදියර I, II සහ III යටතේ රු.24,477,004 ක් වටිනා ඇස්තමේන්තු තුනක් සකස් කර 2014 වර්ෂයේදී රු.23,538,084 ක් වටිනාකමකට ගිවිසුම් තුනක් යටතේ කොන්ත්‍රාත්තුව පවරා කොන්ත්‍රාත්කරු වෙත රු.10,149,852 ක මුදලක් ගෙවා තිබුණි. 2016 මැයි 12 දින වනවිට කොන්ත්‍රාත් ගිවිසුම් කාලය මාස 18 ක් ඉක්මවා ගොස් තිබු නමුත් ඉදිකිරිම් කටයුතු අවසන් කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

සෑම රාජ්‍ය ආයතනයකම සිය දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමේ කාර්යයේදී එකී ආයතනයනට අදාල පාරිසරික හා සමාජ වගකීම් හදුනාගෙන ඒවා ඉටුකිරීම සඳහා උපක්‍රම අනුගමනය කළ යුතු වුවත්, සභාව විසින් ඔවුන්ගේ පාරිසරික හා සමාජ වගකීම හදුනාගැනීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.5 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

# 5 පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය